# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,569 — 1965 නොවැම්බර් 26 වැනි සිකුරාදා — 1965.11.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසට අතිරේකයක් වශයෙන් 1962 අප්‍රේල් සිට ජූනි දක්වා පළකරන ලද පුස්තක නාමාවලියක්ද අඩංගු වේ.]


| | පිට |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 151 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 151 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

1966 වර්ෂය තුළ දෙනියන්දර, දෙනියාය සහ මොරවක යන සංචාරක මහෙස්ත්‍රාත් උසාවි පැවැත්වෙන දිනයන්, මහජනයාගේ දැන ගැනීම සඳහා මෙහි පහත පළකරමි.

| 1966 | දෙනියන්දර | දෙනියාය | මොරවක |
|---|---|---|---|
| ජනවාරි | 7, 21 | 27 | 28 |
| පෙබරවාරි | 11, 25 | 26 | 27 |
| මාර්තු | 4, 18 | 27 | 28 |
| අප්‍රේල් | 1, 22 | 25 | 26 |
| මැයි | 6, 20 | 25 | 26 |
| ජූනි | 3, 17 | 23 | 24 |
| ජූලයි | 1, 15 | 22 | 23 |
| අගෝස්තු | 5, 26 | 20 | 21 |
| සැප්තැම්බර් | 2, 16 | 19 | 20 |
| ඔක්තෝබර් | 14, 21 | 26 | 27 |
| නොවැම්බර් | 4, 18 | 25 | 26 |
| දෙසැම්බර් | 2, 23 | 17 | 18 |

ඇල්. අසෝක ගුණවර්ධන,
මාතර මහෙස්ත්‍රාත් තුමා.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
මාතර මහෙස්ත්‍රාත් උසාවියේ දිය.

11-942

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

### මහනුවර දිස්ත්‍රික් උසාවියේ දීය

මත්තේගම පදිංචි ලියනගේ පීටර් කරුණාරත්න......පැමිණිලිකාරයා.

නො. ඇල්. 7155 එදිරිව

මත්තේගම වරකාගස්තැන්නේ පදිංචි අබවත්තේ හේරත් ආරච්චිගේ පුංචි නෝනා රණසිංහ සහ තවත් අයෙක් ............................................................ විත්තිකරුවන්.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ ඉහත සඳහන් විත්තිකාරයින්ට පහත සඳහන් දේපලවලට තිබෙන අයිති වාසිකම සහ ප්‍රයෝජනයන් වර්ෂ 1965 ක්වූ දෙසැම්බර් මස 21 දින උදේ 11 පැයට එකී ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යොදන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 558 50ක් හා අනෙකුත් මුදල් ඇතුළු පවුන්ඩේජ් මුදල් ආදිය අය කර ගැනීම සඳහායි. එනම් :—

1. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේ ගම්පහ කෝරළේ මත්තේගම තිබෙන අක්කර භාගයක විපසරිය ඇති වරකාගස්තැන්නේ වත්ත නැමැති ඉඩමට මායිම් :—උතුරට : ඇල්ල, නැගෙනහිරට : වරකාගස්තැන්නේ කුඹුර, දකුණට : වරකාගස්තැන්නේ කුඹුර සහ කජුගස්තැන්නේ වත්ත, බස්නාහිරට : වරකාගස්තැන්නේ කුඹුරේ ඉවුර යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ තිබෙන ගෙය, ගසකොළ පළතුරු ආදී සෑම සියළු දේත් සමග වේ.

ර. මු. ජ. රත්නායක,
මු. ප. පිස්කල් වෙනුවට,

1965ක්වූ නොවැම්බර් මස 19 වැනි දින,
මහනුවර පිස්කල් කාර්යාලයේ දීය,

11-1054

151—බී 62847—1,780 (65/11)

D 1

## ගම්පොල දිස්ත්‍රික් උසාවියේ දීය

ගම්පොල හැරකොළ පදිංචි වේලායිතන් සුප්පයියා......පැමිණිලිකාරයා.

නො. 3241 එදිරිව

ගම්පොල හැරපොල පදිංචි උඩකොටුවේගෙදර උක්කුවා ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට පහත සඳහන් දේපලවලට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965ක්වූ දෙසැම්බර් 17 දින උදේ 11 පැයට එම ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 2,500ක් හා අනෙකුත් මුදල් ඇතුළු පවුන්ඩේජ් මුදල් ආදිය අයකර ගැනීම සඳහායි. එනම්:—

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාතේ ගඟඉහළ කෝරළේ හැරපොල පිහිටි තිබෙනු වාඩියගොඩගේනේ (දැනට වත්ත) පර්චස් තිස්හතරකුත් දශම පහක් (අ. 0, රූ. 0, ප. 34.5) ප්‍රමාණය ඇති අංක 2 දරන බිම් කැබැල්ලට මායිම:—උතුරට: ගන්සභා පාර (නැඹිලිගොඩ වත්තට යාව තිබෙන), නැගෙනහිරට: අංක 1 දරන කැබැල්ල, දකුණට: අංක 3 දරන කැබැල්ල සහ බස්නාහිරට: පිකිරි කොල්ලාගේ අයිති ඉඩමට යාව තිබෙන ගම්සභාපාර වේ. මෙහි තුළ තිබෙන ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලි ගහකොළ පළතුරු යනාදී සියළු දේත් සමග වේ. (යූ. ජී. රොසලින් සහ යූ. ජී. අප්පු සිංඤෝ යන දෙදෙනා දැනට පදිංචිව සිටිනු මෙම ඉඩමේ ගෙවල් දෙකේ වර්තනාකම ඔවුනට ඉල්වා සිටීමේ අයිතියට යටත් බව සැලකිය යුතුයි).

ර. මු. ජ. රත්නායක,
මා. ප. පිස්කල් වෙනුවට.

1965ක්වූ නොවැම්බර් මස 18 වැනි දින,
මහනුවර පිස්කල් කාර්යාලයේ දීය.

11-1055

---

# දකුණු පළාත

## තංගල්ලේ දිස්ත්‍රික් නඩු ශාලාවේදී ය

මහතිල්ලේ පදිංචි අම්බල කොඩිතුවක්කුගේ සාමෙල් අප්පුහාමි ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය: පී/677 එදිරිව

3. ඔපනායක හුනුවලවත්තේ පදිංචි තන්කිරිගේ දොන් නිකුලස් ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපළවලින් ඉහත කී නඩුවේ 3 වැනි විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965ක්වූ දෙසැම්බර් මස 20 දින පෙරවරු 10ට එකී ඉඩමේදී රුපියල් පන්සිය තිස්හතයි ශත හතක් (රුපියල් 537.07) අය කර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ මහ හිල්ලේ පිහිටි උතුරට: මාරගහවත්ත; නැගෙනහිරට: එම ඉඩමේ ලොට් 1; දකුණට: එම ඉඩමේ ලොට් 1 සහ 4; බස්නාහිරට: අත්ගල ලොව් ඩී. ඊ. සහ රුක්අත්තනගහවත්ත යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 0, පර්චස් 33ක්වූ කැටකාලගහ වත්ත නමැති ඉඩමේ ලොට් 3 හි පිහිටි බිම, වගාව සහ ගොඩනැගිලි.

එල්. එම්. ආරියපාල,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, තංගල්ල.

වර්ෂ 1965ක්වූ නොවැම්බර් මස 17 දින,
තංගල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

11-1016

---

## මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදී ය

දෙවුන්දර පදිංචි විල්ප්‍රඩ් දී සිල්වා අබේරත්න විරසේකර ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය: එම්.එස්. 49 එදිරිව

තිහිලුව පදිංචි හෙදන් වැලිස් උබේසේකර, විවාහ රිජිස්ට්‍රාර් ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් දෙදස් එකසිය හතලිස් හයයි ශත පහක් සහ සම්පූර්ණයෙන් ගෙවන දින දක්වා නීති ප්‍රකාර පොලියද අය කර ගැනීම සඳහා වර්ෂ 1965ක්වූ දෙසැම්බර් මස 21 දින පෙ. ව. 10ට එකී ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ:—

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවාපත්තුවේ තිහිලුවේ පිහිටි උතුරට: බුලත්වැල්කනත්ත; නැගෙනහිරට: කපුගෙදර; දකුණට: මහපාර; බටහිරට: ඇල්ගිරියෙගෙදර යන මෙකී මායිම් තුළ වූ අක්කර 4 ක් පමණ වූ සුහතිගෙදර නමැති ඉඩමේ බිමෙන් සහ පළතුරුගස්වලින් නොබෙදූ ½ කොටසක්.

2. ඉහත කී පරිදි තිහිලුවේ පිහිටි උතුරට: ඉහළගෙදරවත්ත; නැගෙනහිරට: වඩුගෙදර; දකුණට: මහමය; බටහිරට: මුල්ලෙකුඹුර යන මෙකී මායිම් තුළ වූ අක්කර 4 ක් පමණ වූ කහබිලියගොඩැල්ල නමැති බිමෙන් සහ පළතුරු ගස්වලින් නොබෙදූ ½ ක්.

3. ඉහත කී පරිදි තිහිලුවේ පිහිටි උතුරට: අකරුගොඩගෙදර; නැගෙනහිරට: ලන්දෙවත්ත; දකුණට සහ බටහිරට: කඩිගමුවෙගේ දෙනිය යන මෙකී මායිම් තුළ වූ අක්කර 2 ක් පමණ වූ මාරගහකොරටුව නමැති ඉඩමේ බිමෙන් සහ පළතුරු ගස්වලින් නොබෙදූ ½ ක්.

4. ඉහත කී පරිදි තිහිලුවේ පිහිටි උතුරට: ඉහළගෙදරවත්ත; නැගෙනහිරට: වඩුගෙදර; දකුණට: මහමය; බටහිරට: මුල්ලෙකුඹුර යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර 4 ක් පමණ වූ මුල්ලෙකුඹුර නමැති කුඹුරෙන් නොබෙදූ ½ ක්.

5. ඉහත කී පරිදි තිහිලුවේ පිහිටි උතුරට: බැදිවෙල; නැගෙනහිරට: කම්මල්දෙසිර; දකුණට: ඕමෙකුඹුර; බටහිරට: කහගහකුඹුර යන මෙකී මායිම් තුළ වූ අක්කර 2 ක් පමණ වූ මුත්තෝවටුව නමැති කුඹුරේ නොබෙදූ ½.

6. ඉහත කී පරිදි තිහිලුවේ පිහිටි උතුරට: මහපාර; නැගෙනහිරට: දෙවට; දකුණට: එම ඉඩමේම, කොටසක්; බටහිරට: එම ඉඩමේම කොටසක් යන මෙකී මායිම් තුළ වූ අක්කර 4 ක් පමණ වූ තන්දිබබල්ගෙදරවත්ත නමැති ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහිත බිම සහ පළතුරු ගස්.

එල්. එම්. ආරියපාල,
අතිරේක නියෝජ්‍ය පිස්කල්,
තංගල්ල.

වර්ෂ 1965 ක්වූ නොවැම්බර් මස 17 වැනි දින,
තංගල්ලේ පිස්කල් කන්තෝරුවේ දීය.

11-1015

---

# වයඹ පළාත

## කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේ දී ය

වල්ගම්පත්තු කෝරළේ උරුලැපොත්තේ පදිංචි සිට්ටා දූරයලාගේ උක්කු ........................................ පැමිණිලිකාරි.

නොම්මරය: 13284 එදිරිව

තල්ගහගම පදිංචිව සිට නැසියිය ඇම්. සෙලෙස්තිනු පෙරේරා විත්තිකාරයා වෙනුවට වල්ගම්පත්තු කෝරළේ තල්ගහගම පදිංචි මැද්දගේ ඉග්නේෂියස් පෙරේරා ............අතුරු විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965ක්වූ දෙසැම්බර් මස 20 දින අපරභාග 3ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ:—

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙවමැදි හත්පත්තුවේ වල්ගම්පත්තු කෝරළේ තල්ගහගම පිහිටි කැකිරිගේන නොහොත් මහවැව මුල්ලේගේන නමැති අක්කරයක් පමණ විශාල ඉඩමට මායිම්:—උතුරට: ඩී. ඇම්. හේරත් බණ්ඩාගේ වත්තද සහ තව අයට අයිති ඉඩමද; නැගෙනහිරට: විකිබණ්ඩාට සහ තව අයට අයිති වත්තද; දකුණට: ඩී. ඇම්. බණ්ඩාට අයිති වත්තද; බස්නාහිරට: ආණ්ඩුවෙන් වෙන්කල පාර සහ ලොක්කුගේ වත්තද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම වේ.

ඇස්කිසියේ මුදල රු. 6,862.52 සහ පිස්කල් ගාස්තු ආදියත් අයකර ගැනීමටය.

ලයනල් අ. පොතුහැර,
ව. ප. පිස්කල් වෙනුවට.

වර්ෂ 1965ක්වූ නොවැම්බර් මස 17 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

11-1013

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට වැටීමෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නමට ලැබෙන ලෙස එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.